නව වෙළෙඳ තත්ත්වයන් යටතේ වෙළෙඳාමෙහි රැඳී සිටීම සඳහා රාජ්‍ය අංශයෙහි වෙළෙඳ ආයතන පෞද්ගලික අංශය සමග තව දුරටත් තරග කරන ලදී. රාජ්‍ය වෙළෙඳ ආයතනයන් නව ව්‍යාපාරික කටයුතු වලට යොමු වුව ද, පෞද්ගලික අංශයෙන් එල්ලවූ තරගය නිසා තම කටයුතු වල පහත වැටීමක් ඇතිවූ බව අවබෝධ කරගත්හ. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව සහ අලෙවි දෙපාර්තමේන්තුව, පාරිභෝගික මිළ ගණන්වල ස්ථාවරත්වය පවත්වා ගැනීමටත් අත්‍යාවශ්‍ය භාණ්ඩ වල සුලභතාවය සහ සාධාරණව බෙදාහැරීම සහතික කිරීමෙහිලා වැදගත් වූ ආයතන විය.

විශේෂයෙන්ම අලෙවි දෙපාර්තමේන්තුව නැවත ප්‍රතිසංවිධානය කිරීම, එළවළු ඇතුළු පාරිභෝගික අයිතමයන්ගේ මිළ ගණන් අඩු කිරීමට සැළකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. 1984 දී, පාරිභෝගික මිළ ගණන් අඩු කිරීම සඳහා අලෙවි දෙපාර්තමේන්තුව බොහෝ දුරට ක්‍රියාශීලී කාර්යභාරයක් දැරීය. සමූපකාර තොග වෙළෙඳ ආයතනයේ සම්භාර තොග හැසිරවීමද, මූලික පාරිභෝගික ද්‍රව්‍යයන් සුලභව පවත්වා ගැනීමට උපකාරී වූ අතර, අත්‍යවශ්‍ය භාණ්ඩයන්ගේ මිළ ගණන් ස්ථායීව පවත්වා ගැනීමට ද ඉවහල් විය.

අභ්‍යන්තර වෙළෙඳාමෙහි සමූපකාර සමිතිවලට හිමි කාර්යභාරය ආහාර මුද්දර ක්‍රමය යටතේ සහල්, පිටි, සීනි වැනි මූලික ආහාර ද්‍රව්‍යය සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීම සහතික කරන්නක් බවට පත්වී ඇත. එහෙයින් ඔවුන්ගේ ලාභ තවදුරටත් අඩුව පැවතිණි. කෙසේ වෙතත්, අත්‍යාවශ්‍ය භාණ්ඩ කාර්යක්ෂම ලෙස රට පුරා බෙදා හැරීම හදිසි අවශ්‍යතාවයක් බවට පත්වූ අර්බුදයන් හෝ අභ්‍යන්තර කැළඹීම් පැවති කාල පරිච්ඡේද වලදී සමූපකාර සමිතිවල අත්‍යවශ්‍යතාවය පැහැදිලි විය. එහෙයින් මූල්‍ය පහසුකම් හෝ වෙනත් පහසුකම් ලබා දීම මගින් සමූපකාර සමිතිවල ආර්ථිකමය රඳා පැවැත්ම තහවුරු කිරීම අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියෙහි අරමුණ විය යුතු වේ.

## සංචාරක කර්මාන්තය

සංචාරක කර්මාන්තයෙහි 1983 දී දක්නට ලැබුනු ක්‍රියාකාරී පසුබෑම 1984 දී තරමක් දුරට සමනය වී ගිය බව දක්නට ලැබේ. සංචාරක පැමිණීම්, සංචාරක දින ගණන්, (රාත්‍රී) කාමර උපයෝගීකරණය සහ සංචාරක ඉපැයීම් වැනි මූලික ක්‍රියාකාරිත්වය පිළිබඳ දර්ශකයන් දෙස බැලීමේදී සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට යොමු වීමක් දක්නට ලැබුනත් එහි ක්‍රියාකාරිත්වයෙහි පැවතියේ 1982 සහ 1983 යන දෙවර්ෂයෙහි පැවති තත්ත්වයට වඩා පහත් තත්ත්වයකි. බටහිර රටවල උදාවූ යහපත් ආර්ථික තත්ත්වය හේතුකොට ගෙන 1984 අග භාගයේදී සංචාරක පැමිණීම් අංශයෙහි වැඩිවන උපනතියක් ඇති විය. කෙසේ වෙතත්, ඉන්දියානු රජය විසින්, දෙනු ලැබූ ගමන් බඩු සඳහා වූ තීරු බදු නිදහස් දීමනාව කෙරෙහි සීමාවන් පැනවීමේ හේතුවෙන් ඉන්දියාවේ සිට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව තියුණු ලෙස පහත වැටුණි.

1982 වසරට වඩා සියයට 22 ක හා 1983 වසරට වඩා සියයට 6 ක අඩු වීමක් පෙන්වමින් 1984 දී මෙරටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 3,17,734 ක් විය. බටහිර යුරෝපය, උතුරු ඇමෙරිකාව හා ඕස්ට්‍රලේෂියාව යන රටවලින් පැමිණි සංචාරකයින්ගේ ගණන 1983 පැවති මට්ටමට වඩා වැඩි විය. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක වෙළෙඳපොළ වන බටහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 1984 දී 1,91,070 ක් වූ අතර, සියයට 8 ක වැඩි වීමක් ඉන් පිළිබිඹු වෙයි. එමෙන්ම, අනෙකුත් ප්‍රධාන සංචාරක වෙළෙඳපොළවල් වූ උතුරු ඇමෙරිකාව හා ඔස්ට්‍රලේෂියාවෙන් පැමිණි සංඛ්‍යාවන් පිළිවෙළින් 15,020 ක් හා 11,970 ක් විය. මෙය ඉකුත් වර්ෂයේ මෙම කලාපවලින් පැමිණි සංඛ්‍යාවට වඩා පිළිවෙළින් සියයට 2 ක සහ සියයට 13 ක වැඩි වීමක් පෙන්වයි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස ඉන්දියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව විශාල වශයෙන් පහත වැටීමේ හේතුවෙන්, ආසියානු කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සියයට 28 කින් පහත වැටුණි. 1984 දී මෙරටට පැමිණි

''සංචාරක මගීන්''—එනම් පැය 24 කට අඩු කාලයක් රට තුළ රැඳෙන තාවකාලික සංචාරකයින් සංඛ්‍යාව, (සංක්‍රාමික මගීන් හැර) 8,638 ක් විය. මෙය 1983 වර්ෂයට අදාළවූ 7,208 හා සසඳන විට සියයට 20 ක් තරම් වූ සැළකිය යුතු වර්ධනයකි.

සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය දැක්වීමෙහි ලා මුළු සංචාරක පැමිණීම් වලට වඩා යෝග්‍ය දර්ශකයක් ලෙස සැළකෙන සංචාරකයන් රට තුළ ගත කළ මුළු දින ගණන (රාත්‍රි) 1984 දී 28,18,694 ක් වූ අතර, එය 1983 සංඛ්‍යාවට වඩා සියයට 11 ක පහත වැටීමකි. මෙය 1982 සංඛ්‍යාව හා සසඳන විට සියයට 22 ක විශාල අඩු වීමක් පෙන්නුම් කළේය. සංචාරකයකු රට තුළ ගත කරන සාමාන්‍ය දින ගණන 1983 දී දින 10 ක් වූ අතර, 1984 දී එය දින 9 දක්වා අඩු විය.

**1 . 34 සංඛ්‍යා සටහන**

**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන 1983 – 1984**

| ශීර්ෂය | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස | 1984* | 1983 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1· සංචාරක පැමිණීම .. | 337,530 | –17·1 | 317,734 | – 5·9 |
| 2· පැය 24 කට අඩු කලකට රට තුළ රැඳෙන විදේශික මගීන්ගේ පැමිණීම .. | 7,208 | 8·7 | 8,638 | 19·8 |
| 3· සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) .. | 3,179 | –21·5 | 2,819 | – 11·3 |
| 4· සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4·1 රුපියල් දශ ලක්ෂ .. | 2,896·1 | – 5·1 | 2,737·8 | – 5·5 |
| 4·2 එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ .. | 126·9 | –13·4 | 105·3 | – 17·0 |
| 4·3 වි·ගැ·හි· ඒකක දශ ලක්ෂ .. | 115·1 | –13·3 | 105·0 | – 8·7 |
| 5· පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන | | | | |
| 5·1 විනෝදය .. | 306,626 | –15·1 | 300,336 | – 2·1 |
| 5·2 ව්‍යාපාරික කටයුතු .. | 19,378 | – 9·5 | 10,934 | – 43·6 |
| 6· කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6·1 බටහිර යුරෝපය .. | 176,310 | –23·4 | 191,070 | 8·4 |
| 6·2 ආසියාව .. | 124,620 | – 7·8 | 89,736 | – 28·0 |
| 6·3 උතුරු ඇමෙරිකාව .. | 14,686 | – 5·4 | 15,020 | 2·3 |
| 7· මුළු සේවා නියුක්තිය .. | 53,608 | –16·6 | 59,462 | 10·9 |
| 7·1 සෘජු .. | 22,374 | –16·4 | 24,595 | 9·9 |
| 7·2 වක්‍ර .. | 31,234 | –16·7 | 34,868 | 11·6 |

* තාවකාලික — මූලය: ලංකා සංචාරක මණ්ඩලය

ඉකුත් වර්ෂවලදී මෙන්ම, 1984 දී ප්‍රධාන වෙළෙඳපල වන බටහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින් ප්‍රමාණය මුළු සංචාරක පැමිණීම් වලින්, සියයට 60 ක් වූ අතර, 1983 සංඛ්‍යාව හා සසඳන විට එය සියයට 52ක් විය. විශාලත්වයෙන් දෙවන තැන ගන්නා ආසියානු කලාපීය වෙළෙඳපොල කොටස 1983 දී සියයට 37 ක්ව තිබී, 1984 දී සියයට 28 දක්වා පහත වැටී ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ ඉන්දියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සියයට 53 කින් අඩු වීමයි. ඔස්ට්‍රලේෂියාව හා උතුරු ඇමරිකානු වෙළෙඳපොල කොටස්හි වෙනසක් සිදුවී නොමැත.

1984 දී සංචාරක කර්මාන්තයේ ඇස්තමේන්තුගත දළ විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණය රුපියල් 273 කෝටි 80 ලක්ෂයක් වූ අතර, (විගැහි 10 කෝටි 50 ලක්ෂයක්) ඉකුත් වසරට වඩා එය සියයට 5 ක පහත වැටීමක් (විගැහි වටිනාකම අනුව සියයට 9 ක්) පෙන්නුම් කළේය. දේශ සංචාරයේ අරමුණ අනුව බලනවිට සංචාරකයින් මෙරටට පැමිණීමේ ප්‍රධාන පරමාර්ථය "විනෝදාශ්වාදය" වූ බව පෙනේ. 1984 දී එම පරමාර්ථයෙන් පැමිණි ප්‍රමාණය මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 95 ක්ද, 1983 දී සියයට 91 ක්ද විය. ව්‍යාපාරික අරමුණ සඳහා පැමිණි ප්‍රමාණය 1984 දී සියයට 3 ක් වූ අතර, 1983 දී එය සියයට 5 ක් විය.

පසුගිය වසර වලදී මෙන්ම, ශ්‍රී ලංකාවට පැමිණීමේ ප්‍රධාන ගමන් මාධ්‍යය ගුවන් මාර්ගය විය. ගුවන් මගින් පැමිණි මුළු සංචාරකයින් ප්‍රමාණයෙන් නියමිත අන්තර් කලාපීය සහ කලාපීය ගුවන් යානා මගින් පැමිණි ප්‍රමාණය සියයට 79 ක් වූ අතර, සියයට 17 ක් පමණ සංචාරකයින් කුලී ගුවන් යානාවලින් පැමිණ තිබේ. 1983 දී සියයට 12 ක් වූ මුහුදු මගින් පැමිණි සංචාරක මගී ප්‍රමාණය 1984 දී සියයට 4 දක්වා අඩුවිය.

සංචාරක ව්‍යාපාරය සෘජු ලෙස සහ වක්‍ර ලෙස සේවා අංශයෙහි පුළුල් වශයෙන් රැකියා අවස්ථාවන් සළසා ඇත. 1983 ට වඩා සියයට 11 ක වැඩි වීමක් පෙන්වමින් 1984 දී සංචාරක ව්‍යාපාරය මගින් සැළසුණු මුළු රැකියාවන් ගණන 59,500 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඇස්තමේන්තුගත සෘජු රැකියාවන් ගණන 1983 දී 22,400 ක් වූ අතර, 1984 දී එය 24,600 දක්වා එනම්, සියයට 10 කින් වැඩිවූ බව ගණන් බලා ඇත. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත විවිධාකාර සේවා අංශයන් තුළ උත්පාදනය වූ වක්‍ර රැකියාවන් ගණන 1984 දී 34,900 ක් විය. මෙය 1983 වර්ෂයේ අදාළ සංඛ්‍යාවට වඩා සියයට 12 ක් වැඩි වීමකි.

1983 දී ඒකක 138 ක් වූ ශ්‍රෙණිගත නවාතැන් අංශයේ ධාරිතාවය සියයට 6 ක වැඩි වීමක් පෙන්වමින් 1984 දී ඒකක 146 ක් බවට පත්විය. මෙය 1974–1983 අතර කාලච්ඡේදය තුළ ශ්‍රෙණිගත නවාතැන් සංඛ්‍යාවෙහි සාමාන්‍ය වාර්ෂික වර්ධනය වූ සියයට 10 හා සැසඳිය හැකිය. 1983 දී 8,852 ක් වූ ශ්‍රෙණිගත නවාතැන් අංශයෙහි මුළු කාමර ගණන 1984 දී 9,627 දක්වා වැඩි විය. ශ්‍රෙණිගත හෝටල්වල සාමාන්‍ය කාමර උපයෝගීතා අනුපාතය 1983 දී මෙන්ම 1984 දීත් සියයට 36 ක් විය. 1983 දී 1,251 ක්වූ අතිරේක නවාතැන් අංශයේ මුළු කාමර ගණන 1984 දී 1,270 දක්වා, සුළු වශයෙන් වැඩිවී තිබේ. විමසුමට ලක්වන වසර තුළදී ශ්‍රෙණිගත නවාතැන් අංශයෙහි මෙන්ම අතිරේක නවාතැන් අංශයෙහි ද සාමාන්‍ය කාමර උපයෝගීතා අනුපාතය නොවෙනස්ව පැවතුණි. මුලින් සඳහන් කල පරිදි, උපයෝගිතා අනුපාතය නොවෙනස්ව පැවතීමෙන් පැහැදිලි වන්නේ සංචාරකයන් මෙරට ගත කරන කාලයේ පැවති කෙටි බවයි.

1984 වර්ෂයේ ශ්‍රෙණිගත නවාතැන් අංශයේ කලාපීය තොරතුරු වලට අනුව, පසුගිය කාලයෙහි වූ උපනතිය තහවුරු කරමින් කොළඹ නගරය සහ මහ කොළඹ ප්‍රදේශයේ පිළිවෙලින් සියයට 45 ක සහ සියයට 38 ක උපයෝගීතා අනුපාතයක් දක්නට ලැබේ. කෙසේ වෙතත්, මෙම සංඛ්‍යාවන් 1983 මුල් භාගය හා අග භාගයේ සංඛ්‍යාවන් හා සසඳන විට, පිළිවෙලින් ප්‍රතිශතක 7 ක සහ ප්‍රතිශතක 2 ක අඩු වීමක් පෙන්නුම් කරයි. ශ්‍රෙණිගත නවාතැන් අංශයේ ඉහළම ධාරිතාවයක් පැවති දකුණු වෙරළබඩ ප්‍රදේශයේ උපයෝගීතා අනුපාතිකය ඉකුත් වසර හා සසඳන විට ප්‍රතිශතක 2 ක සුලු වැඩි වීමක් වාර්තා කරමින්, 1984 දී සියයට 34 ක් විය. 1984 දී කන්ද උඩරට සහ පෞරාණික නගරවල උපයෝගීතා අනුපාතය පිළිවෙලින් සියයට 32 ක් හා සියයට 31 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට, සියයට 11 ක උපයෝගීතා අනුපාතයක් පැවති උතුරු දිග ප්‍රදේශයෙහි 1984 දී සියයට 6 ක් වූ පහළම උපයෝගීතා අනුපාතයක් දක්නට ලැබිණි.

විමසුමට ලක්වන වසරේදී සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා සංචාරක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කඩිනම් අලෙවි වැඩපිළිවෙළ තවදුරටත් ගෙන යන ලදී. මේ සඳහා විදේශ වෙළෙඳපොළ පුළුල් කිරීමේ කටයුතු සඳහා ආසන්න වශයෙන් රුපියල් හාර කෝටි 90 ලක්ෂයක් වැය කරන ලදී. රජය විසින් ද සංචාරක කර්මාන්තය සඳහා පහසුකම් රාශියක් සළසා ඇත. මේවා අතර වාණිජ බැංකු හා වෙනත් දිගුකාලීන ණය දෙන ආයතන විසින් හෝටල් ව්‍යාපෘති සඳහා ප්‍රදානය කරන ලද ණය පහසුකම් නැවත උපලේඛණගත කිරීම හා සංචාරක කර්මාන්තයේ පසුබෑම හේතුවෙන් හෝටල් කරුවන්ට මුහුණ පෑමට සිදුවී ඇති මූල්‍ය දුෂ්කරතාවයන්ට සහනයක් වශයෙන් පිරිවැටුම් බදු සියයට 10 සිට සියයට 5 දක්වා අඩු කිරීම ද ඇතුලත් වේ.

## ගෙවුම් තුලනය

ජංගම ගිණුමේ හිඟය විශාල වශයෙන් අඩුවීම නිසා 1984 තුලදී ගෙවුම් තුලන කටයුතුවල සැළකිය යුතු දියුණුවක් ඇති විය. වෙළෙඳ අනුපාතයේ ඇති වූ ඉමහත් වැඩි දියුණුව හා විදේශ පෞද්ගලික ප්‍රේෂණ තව දුරටත් ඉහළ යෑම ජංගම ගිණුමේ හිඟය මෙසේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 1983 දී රුපියල් 1,112 කෝටි 20 ලක්ෂයක් (විගැහි 44 කෝටි 10 ලක්ෂයක්) වූ ජංගම ගිණුමේ හිඟය විමසුමට ලක්වන වසර තුළදී රුපියල් 78 කෝටි 90 ලක්ෂය (විගැහි දෙකෝටි 60 ලක්ෂය) දක්වා අඩු විය. 1984 වර්ෂය තුළදී වෙළෙඳ භාණ්ඩ ගිණුමේ ද එවැනිම දියුණුවක් දක්නට ලැබිණි. විගැහි වටිනාකම අනුව අපනයන සියයට 45 ක වැඩිවීමක් වාර්තා කළ අතර, ආනයන වැඩිවූයේ සියයට 1.7 ක් වූ සුළු ප්‍රමාණයකිනි. ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 1983 දී සියයට 9.1 සිට 1984 දී සියයට 0.5 දක්වා අඩු විය. නිළ සංක්‍රාම ඉවත් කළ පසු ජංගම ගිණුමේ හිඟය 1983 දී රුපියල් 1,513 කෝටි 80 ලක්ෂයේ (විගැහි 60 කෝටි 10 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 469 කෝටි 20 ලක්ෂය (විගැහි 17 කෝටි 60 ලක්ෂය) දක්වා අඩු වූ අතර, මෙම හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කළ වර්ෂ දෙක අතරතුර කාලයේ දී සියයට 12.4 සිට සියයට 3.1 දක්වා පහළ වැටිණි.

වෙළෙඳ භාණ්ඩ අපනයන වලින් 1983 දී රුපියල් 2,503 කෝටි 80 ලක්ෂයක් (විගැහි 99 කෝටි 30 ලක්ෂයක්) ලැබුණ අතර, අපනයන පරිමාව මෙන්ම මිළ ගණන් ද වැඩිවීම නිසා එම ලැබීම් 1984 දී රුපියල් 3,745 කෝටි 30 ලක්ෂය (විගැහි 143 කෝටි 90 ලක්ෂය) දක්වා වැඩි විය. තේ අපනයන ඉපැයීම් පමණක් රුපියල් 746 කෝටි 90 ලක්ෂයකින් (විගැහි 27 කෝටි 50 ලක්ෂයකින්) වැඩි විය. ප්‍රධාන අපනයන නිෂ්පාදන තුනෙන්ම ලත් අපනයන ඉපැයීම් වල එකතුව 1984 දී රුපියල් 806 කෝටි 20 ලක්ෂයකින් (විගැහි 29 කෝටි 10 ලක්ෂය-කින්) වැඩි විය. ප්‍රධාන වශයෙන් රෙදි පිළි සහ මසා නිමකල ඇඳුම් හා අනිකුත් කාර්මික නිෂ්පාදන ඇතුළු සම්ප්‍රදායික නොවන අපනයන, සැළකිය යුතු ලෙස වැඩි වීම අපනයන අංශයේ ඇති වූ කැපී පෙනෙන ලක්ෂණය විය. සම්ප්‍රදායික නොවන නිෂ්පාදන වලින් ලත් අපනයන ඉපැයීම් 1984 දී සියයට 28 කින් ඉහළ ගියේය.

1983 දී රුපියල් 4,520 කෝටි 60 ලක්ෂයක් (විගැහි 179 කෝටි 40 ලක්ෂයක්) වූ භාණ්ඩ ආනයන වියදම 1984 දී රුපියල් 4,762 කෝටි 60 ලක්ෂයක් (විගැහි 182 කෝටි 50 ලක්ෂයක්) විය. ප්‍රධාන වශයෙන් සහල්, සීනි සහ කල් පවතින පාරිභෝගික භාණ්ඩ ඇතුළුව පාරිභෝගික භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන වියදම 1984 දී පහත වැටුණි. ඒ අනුව මුළු ආනයන වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඛණිජ තෙල් නිෂ්පාදන හැර අනිකුත් අන්තර් භාණ්ඩ ආනයනය වැඩිවීමයි.